# ගංගාවේ සංගීතය

## සිංහල සාහිත්‍ය සංග්‍රහය

### 10 ශ්‍රේණිය - III වාරය

- නිපුණතාව - 14.0 - සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- නිපුණතා මට්ටම - 14.5 - නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.
- ඉගෙනුම් ඵල - ★ කවි පන්තියේ තේමාව හඳුනාගෙන ඉදිරිපත් කරයි.
  ★ නිර්දිෂ්ට කවියේ නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
  ★ කවි පන්තිය රසවිඳිමින් විචාරය කරයි.



කුණාටුව කාව්‍ය සංග්‍රහය



සුවඳ කවි සඟරාව


ඈ කාව්‍ය සංග්‍රහය


එච්. එම්. කුඩලිගම


පී . බී. ෂෙලී

**<u>ක්‍රියාකාරකම - 1</u>**

★ හිස්තැනට සුදුසු පදය වරහනින් තෝරා ලියන්න.

1. එච්.එම්. කුඩලිගම -------------------------------- යුගයේ කවියෙකි.
2. ඇඩි කැමැත්තෙන් ඔහු වර්ණනා කළේ ---------------------------------- යි.
3. කුඩලිගම උපන්නේ කළුතර ------------------------------- දී ය.
4. උසස් අධ්‍යාපනය ලැබුවේ ------------------------------------------- ය.
5. එච්.එම්. කුඩලිගම වෘත්තියෙන් --------------------------------------- යෙකි.
6. ------------------------------- සඟරාව ඔහු සංස්කරණය කළේ ය.
7. කුඩලිගම කවියාට යෙදුණු අන්වර්ථ නාමය වන්නේ ------------------------------------ යන්නයි.
8. ---------------------------------- කිවිඳුන්ගේ නිර්මාණවලින් ආභාසය ලැබූ බව ඔහු ලියා තිබේ.
9. වර්ෂ ---------------------- දී ඔහු අභාවප්‍රාප්ත විය.

10. ඔහුගේ ඉතා ජනප්‍රිය ම කාව්‍ය සංග්‍රහය -------------------------------------- ය.

[ සිංහල ෂෙලී , රවින්ද්‍රනාත් තාගෝර් , සුවඳ , 1973 , කොළඹ , ඇ , ස්වභාව සෞන්දර්ය , පුවත්පත් කලාවේදී , ධර්ම විජය පිරිවෙන , කුඩලිගම ]

<u>ක්‍රියාකාරකම - 2</u>

★ සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. කුඩලිගම කවියා සේවය කළ පුවත්පතක් නොවන්නේ ,

   1. දිනමිණ 2. ලංකාදීප
   3. ජනතා 4. සිළුමිණ

2. ඔහුගේ කවි බස වඩාත් ළං වූයේ ,

   1. ජනවහරට ය. 2. කටවහරට ය.
   3. වියත් වහරට ය. 4. ගැමි වහරට ය.

3. ඔහු ඇතුළත් වන යුගයේ ඔහුට සමකාලීන කවියෙකු නොවන්නේ ,

   1. මීමන ප්‍රේමතිලක 2. සාගර පලන්සූරිය
   3. අල්විස් පෙරේරා 4. ආනන්ද රාජකරුණා

4. ඔහු විසින් රචනා කළ ග්‍රන්ථයක් නොවන්නේ ,

   1. දේදුන්න 2. කුණාටුව
   3. සංවාදය 4. එකෝමත් එක රටක

5. කුඩලිගම කවියාට කාව්‍යකරණයේ දී අද්දැකීම් නොවූයේ ,

   1. ප්‍රේමය 2. සොබාදහම
   3. ජාතිකානුරාගය 4. මනුෂ්‍ය ජීවිතය

<u>ක්‍රියාකාරකම - 3</u>

★ පහත සඳහන් පදවලට සමාන පද පාඩමෙන් සොයා ලියන්න.

1. රිදී - -------------------------------- 2. නිශ්චල - --------------------------------
3. ක්ෂණයෙහි - ------------------------------ 4. කම්මැළි - --------------------------------
5. පියවර - -------------------------------- 6. කඳු මුදුන් - --------------------------------
7. සනාතන දහම - --------------------------- 8. ස්වාමියා - --------------------------------
9. බාධක - -------------------------------- 10. සිඳු - --------------------------------

ක්‍රියාකාරකම - 4

★ පහත සඳහන් යෙදුම්වල අදහස [ආ] කොටසින් තෝරා එහි අංකය ඉදිරියෙන් ලියන්න.

[ අ ]

1. පහළට ඇදී පර මල් පෙති ඉවත නොළා [ ]
2. හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි [ ]
3. නිරසයි අතරමග අවහිර නොදුටු බිම [ ]
4. මහ වන බිමක් මැද ගිරි කුළු අතර සිට [ ]
5. හිරිමල් සිනා රැලි පෙණ පිඬු මිහිරිතම [ ]

[ ආ ]

1. මහා වනාන්තරයක් මැද කඳු මුදුන් මත සිට
2. පර වූ මල් පෙති ද අත් නොහැර පහළට ගලා විත්
3. තරුණයෙකුගේ මිහිරි සිනා නැමැති රැලි හා පෙණ පිඬු
4. මුණ ගැසුණු විට ම මා සතු භාරය ඔහුට පවරමි.
5. අතරමග බාධක නොමැති භූමියේ ගලා යාමෙහි රසයක් නැත.

ක්‍රියාකාරකම - 5

★ මෙහි සඳහන් කර ඇති කාව්‍යෝපක්‍රම හා ලක්ෂණ සඳහා උචිත නිදසුන් සහිත පද්‍ය පාද ලියන්න.

1. රූපකාලංකාරය - ----------------------------------------
2. ස්වභාවෝක්ති අලංකාරය - ----------------------------------------
3. ව්‍යංග්‍යාර්ථ - ----------------------------------------
4. සංකේතාර්ථ - ----------------------------------------
5. උත්ප්‍රේක්ෂාලංකාරය - ----------------------------------------
6. ගැඹුරු විචාර චින්තනය - ----------------------------------------
7. අනුප්‍රාසාත්මක යෙදුම් - ----------------------------------------
8. රිද්මානුකූලභාවය - ----------------------------------------
9. කාව්‍යාත්මක යෙදුම් - ----------------------------------------
10. සංකල්ප රූප - ----------------------------------------
11. සරල බස් වහර - ----------------------------------------
12. ව්‍යාකරණානුකූලත්වය - ----------------------------------------

ක්‍රියාකාරකම - 6

★ රස නිෂ්පත්තිය සඳහා කවියා භාවිත කරන විවිධ කාව්‍යෝපක්‍රම විස්තර කරන්න.

[ ඒ සඳහා පහත සඳහන් විචාර සැකිල්ල ප්‍රයෝජනයට ගන්න. ]

1. ප්‍රවේශය
2. විග්‍රහය - 
   - කවියා භාවිත කළ රසෝත්පාදක කාව්‍යෝපක්‍රම.
   - සරල සුගම බස [ කඳු බෑවුමක දං බෝවිටි ...... ]
   - සංකල්ප රූප [ සැඟවෙමි , එබෙමි, නිසසල වෙමි ....... ]
   - ව්‍යංග්‍යාර්ථවත් පද යෙදුම් [ එන්නේ කොයි සිට ද ....... ]
   - ස්වභාවෝක්ති අලංකාරය [ මී අඹ කිරල මාදං....... ]
   - ශබ්ද රසය මතු කිරීම - එළිසමය , අනුප්‍රාසය , විරිත

     [ රන් තරු පිරිවරා ගත් සඳ ......... ]
3. නිගමනය

ක්‍රියාකාරකම - 7

★ මෙම පදය නිර්මාණයෙන් කවියා ඉදිරිපත් කරන ජීවන දර්ශනය පැහැදිලි කරන්න.

[ ඒ සඳහා පහත විචාර සැකිල්ල ප්‍රයෝජනයට ගන්න. ]

1. ප්‍රවේශය
2. විග්‍රහය - 
   - ජීවන දර්ශනය
     - එන්නේ කොයි සිට ද ..............
     - මී අඹ කිරල මාදං ගෙඩි ............
     - රන්තරු පිරිවරාගත් සඳ මඬල ............
3. නිගමනය

පිළිතුරු

ක්‍රියාකාරකම - 1

1. කොළඹ
2. ස්වභාව සෞන්දර්ය
3. කුඩලිගම
4. ධර්ම විජය පිරිවෙන
5. පුවත්පත් කලාවේදී
6. සුවඳ
7. සිංහල ෂෙලී
8. රවීන්ද්‍රනාත් තාගෝර්
9. 1973
10. ඈ

ක්‍රියාකාරකම - 2

1. ලංකාදීප
2. කටවහරට ය.
3. ආනන්ද රාජකරුණා
4. දේදුන්න
5. ජාතිකානුරාගය

ක්‍රියාකාරකම - 3

1. කලදෝ
2. නිසසල
3. කෙණෙහි
4. අලස
5. අඩි
6. ගිරිකුළු
7. හේලි දහම
8. හිමි
9. අවහිර
10. මුහුදු

ක්‍රියාකාරකම - 4

1. 2
2. 4
3. 5
4. 1
5. 3

ක්‍රියාකාරකම - 5

1. කවදා කොතැනකදි හෝ මහ මුහුද හිමි
2. සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ
3. කොඳුරමි කෙදිරියක් මුළු ලොව නිසල කොට
4. මල් පෙති වියළි කොළ එන අතකට එද්දෙන්
5. ඇකයෙහි හෙළා හඬවයි සැඬ සුළඟ රැයේ
6. එන්නේ කොයි සිට ද කොතැනකට ද යන්නේ
7. ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම
8. සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
9. කෙකටිය ඕලු නළියන දිය රැලි මැද්දෙන්
10. රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට
11. මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
12. සංගීතවත් වී යමි ඉදිරියට ගලා

ක්‍රියාකාරකම - 6

★ දී ඇති විචාර සැකිල්ල ඇසුරු කරගෙන විචාරයක් ලියා තිබිය යුතුයි.

ක්‍රියාකාරකම - 7

★ දී ඇති විචාර සැකිල්ල උපයෝගි කරගෙන විචාරයක් ලියා තිබිය යුතුයි.